# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
011 286 4051


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } ඉ.කො.ජ./විවිධ | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2020.05.06 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>රජයේ ඉඩම් ආරක්ෂා කරගැනීම</u>**

රට තුල ව්‍යාප්තව පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන්, ඔබ හා ඔබගේ ක්ෂේත්‍ර නිලධාරීන් ඉතාමත් කාර්යබහුල මෙම අවස්ථාවේදී, රජයේ ඉඩම් අනවසර අල්ලාගැනීම් සිදුවන බවට නිරන්තරයෙන් පැමිණිලි ඉදිරිපත් වී ඇත.

02. ඔබ හා ඔබගේ ක්ෂේත්‍ර නිලධාරීන් වසංගත තත්ත්වය පාලනය කරමින් ජන ජීවිතය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා සිදුකරන කර්තව්‍යය අගය කරමි. එසේම අනාගතයේදී රටේ ඇතිවිය හැකි ආහාර හිඟයට විසඳුමක් ලෙස ඌන උපයෝජිත රජයේ ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා ඵලදායීව යොදාගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරන මෙවැනි අවස්ථාවක රජයේ ඉඩම් ආරක්ෂා කරගැනීම ද ඉතා වැදගත්වේ.

03. එබැවින් රජයේ ඉඩම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය හා ක්‍රමවේදය ශක්තිමත්ව හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් රජයේ ඉඩම් ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛ හා අණපනත්වල නියෝග ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

(අත්සන)
ආර්.එම්.සී.එම්.හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
2. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

} කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා


ආයතන / நிர்வாகம் / Admin ☎ 011 279 7479 | 011 287 3033
ගිණුම් / கணக்கு / Accounts ☎ 011 287 5833 | 011 286 4462
ඉඩම් I / காணி I / Land I ☎ 011 287 4025 | 011 288 3812
ඉඩම් II / காணி II / Land II ☎ 011 287 5834 | 011 287 3110
ඉඩම් III / காணி III / Land III ☎ 011 279 7482 | 011 288 3635

ඊමේල් ஈ-மெயில் E-mail - landcom@landcommdept.gov.lk    වෙබ් ලිපිනය இணையம் Web Address - www.lancommdept.gov.lk